

# සන්තාපය විඩාව සහ දිවි මගේ මැදිවිය

දිවි මංසලේ මැදිවිය යනු ළදරු ළමා සහ තරුණ විය ඉක්ම ගිය තැන එළඹෙන ජීවිතයේ තවත් එක්තරා වැදගත් කාළපරිච්ඡේදයකි. ජීවිතයේ විඩා නිවන්නට ඉසිඹුලන සැඳෑ සමයට පෙර එළඹෙන මෙම කාලසීමාව තුල විඩාවල සාංකාව වැනි නොයෙකුත් ව්‍යාදීන්ට ජීවිතයේ අන් කවර කලකදීටත් වඩා මුහුණපාන්නට සිදුවන බව නම් බොහෝ දෙනා අත්දැකීමෙන්ම පසක්කරගත් කරුණකි.

මගේ මෙම ලිපියෙහි මුඛ්‍ය පරමාර්ථය නම් මධ්‍ය භාගයේ සාංක්‍රමනික ශ්‍රී ලාංකිකයන්ගේ පළමු පරම්පරාව මෙම ප්‍රශ්ණයට මුහුණදෙන ආකාරය ගැන මට හැඟෙන යමක් පත් ඉරුවක සටහන් කිරීමයි.

එක්දහස් නවසිය අසූව දශකයේ අගභාගයේ සහ අනූව දශකයේ මුලභාගයේ තරම ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයන් බොහෝමයක් දෙනා මෙහි පැමිණියේල වෘත්තීය කුසලතාවයන-"ට ලබා දුන් ලකුණු ක්‍රමයක් පදනම් කර ගනිමිනි. එම කාල වකවානුවේදී ජව සම්පන්න තරුණ වියෙහි වූ එම සියලම දෙනා මේ වන විටල මා කතා කරන මැදිවියට එළඹ සිටින්නේ වෙනස් කළ නොහැකි ලෝක ධර්මතාවයට හිස නමා ගරු කරමිනි.

සාර්ථක ආර්ථික පදනමක් සහිත වඩාත් යහපත් හෙටදිනක අරුණලු දකින රිසියෙන් ඔස්ට්‍රේලියාවට සපැමිණි බොහෝ දෙනෙකුගේ පරමාර්ථය තමා ඔලුව ඔසවන අතරම තම පවුල්වල සෙස්සන්ට නැගිටීමටද තම අත පෑමයග මේ සඳහා අපට වෙහෙස නොබලා දුවන්නට සිදුවේග ඒ මන්ද යත් හති වැටෙන්නේ දුවන තරමට නිසාය.

මුලින් අප නොදැනුවත්වම මෙන් ඇදවැටෙන මෙම තරඟයේ හොඳ නරක කල්පනා කිරීමට තරම්වත්ල ආරම්භයේදී අප කාලය මිඩංගු කිරීමට පැකිලෙන නිසා කිසිම වග විභාගයකින් තොරව අපි ද අනෙකා පසුපස දිවීම ආරම්භ කරන්නෙමු.. අතර මගකදී සත්‍ය අවබෝධ වන නමුත් ඒ වනවිට හැල්මේ දුවනවා හැරෙන්නට ආපසු හැරෙන්න අපට හැකියාවක් නැත. නුවණැති අතලොස්සක් හැරෙන්නට බහුතරයක් දෙනා තම මැදි වයසට එළඹෙන්නේ අනේකවිධ වියදම්වලට අමතරව දැරිය නොහැකි තරමේ පරිමාවකින් යුතු නිවාස ණයක්ද සමගිනි

එසේ නැතහොත් ස්වාමිපුරුෂයා කරන ප්‍රධාන වෘත්තියට අමතරව තවත් ආදායමක් ලබා ගැනීමට රැකියාවෙන් පසු හෝ සති අන්තයේදී දෙවන රැකියාවක්ද කළ යුතුය. මෙය දැරිය නොහැකි තරමේ විඩා ගෙනදෙන්නක් බව නොක-"වමනාය.

අඹු සැමි දෙදෙනාම ශ්‍රම බලකායට එක්වූ පවුල්වල ආර්ථික පසුබිම යම් තරමක සුභ මට්ටමක පවතින මුත් අභ්‍යන්තරය තුල ඇති අනේකවිධ ගැටලුවලට මුහුණදෙන විට ඇතිවන මානසික විඩාව ගැන සිතන කල්හි එසේ උපයන මුදල්වලින් කවර ඵලයක්දැයි සිතෙන තරම්ය.

මා පෞද්ගලිකව දන්නා රැකියාවන්හි නිරත බොහෝ ශ්‍රී ලාංකික පවුල්වල දෙන්නා දෙමහල්ලෝ එකට මුණගැසී කතාබහ කරන්නේ සති අන්තයේ පමණි. එයට හේතුව බිරිඳ හා සැමියා දෙමාරුවට රැකියාවන්හි නිරතවීම නිසා සතියේ දිනවල එක් අයකු වැඩ මුරය අහවර ගෙදර පැමිණෙන විට අනෙකා තම වැඩ මුරය සඳහා ගෙදරින් පිටත්ව ගොස් සිටීමයි. සාර්ථක පවුල් ජීවිතයක් සඳහා මේ මගින් එල්ලවන බලපෑම මෙපමණකැයි පැවසිය හැකි සමතෙකු ගැන සිතා ගැනීමට මට මෙන්ම ඔබටද නොහැකිවනවා නො අනුමානය.

පවුලක් ලෙස දෙමව්පියන් හා දරුවන් එක්ව දවසේ කොයි මොහොතක හෝ සුහද සාකච්ඡාවක නිරත වීම එම පවුලේ එකිනෙකා අතර අන්‍යෝන්‍ය බැඳීම තහවුරු වීම සඳහා ප්‍රබලම සාධකයක් ලෙස ක්‍රියා කරයි. වඩාත්ම පිළිගත් මතය වන්නේ රාත්‍රී කෑම මේසය මේ සඳහා ඉතාම සුදුසු අවස්ථාව බවයි. නමුත් අවාසනාවකට මෙන් සවස වැඩ මුරයට යන මව හෝ පියාට දරුවන් දකින්නේ උදෑසන පාසලට යන සුලු කාලය තුල පමණිග උස මහත් වූ දරුවන් හා දෙමාපියන් අතර ඇති කර ගත යුතු ප්‍රබල බැඳීම ගොඩනගා ගැනීමට එම සුලු කාලසීමාව කවර නම් ආකාරයකින් සෑහේද?

එමෙන්ම දුරකථනයට පිං සිදුවන්නට සතියේ දින පහම දුරකථන සංවාදය ඔස්සේ පවුල් කන අඹුසැමියන්ට මානසික පීඩනය විඩාව දැනීම පුදුමයට කරුණක් නොවන බව මගේ හැඟීමයි.

රැකියාවන්හි නිරත බොහෝ අයවලුන්ට දැනෙන මානසික විඩාවට එක එල්ලේම බලපාන අනිත් කාරණය වන්නේ බහුතරයකට තමන් නියැලෙන රැකියාව තුලින් මානසික තෘප්තියක් නොලැබීමයි. වේතනය ලැබෙන්නේ ඩොලර්වලින් නිසා හිත හදාගෙන තමන්ගේ ජීවන වෘත්තියෙහි නියැලුනත් එයින් සිදුවන්නේ කුටුම්බ රක්‍ෂණයට පමණක් නම් එසේත් නැතහොත් ඉතාමත් සරලව උදර පෝෂණයට පමණක් නම් එයින් ලබා ගත හැක්කේ කුමණ ආකාරයක සංතුෂ්ඨියක්ද? සතුට කෙසේ නමුත් දැරිය නොහැකි තරමේ ආත්ම අනුකම්පාවක්දල අවසන වචනයෙන් විස්තර කළ

**සුභාෂිනී හේරත්**

ඇටිවුඩ්

නොහැකි තරමේ මානසික විඩාවක් නම් අපට ඉතිරි වේ.

මැදිවියේ දෙමාපියන් ඊලඟට මුහුණදෙන තවත් ගැටලුවක් නිර්මාණය කරනු ලබන්නේ දිනෙන් දින යොවුන් වියට එලැඹෙන ඔවුනගේම දූ දරුවන් විසිනි.

විදේශ ගතවීමත් සමග තම අක්මුල් සිඳගෙන පරසිරිත් දෝතින් වැලඳගත් සුලුතරයකට හැරුන කල බහුතරයක් දෙමව්පියන්ට මෙම ප්‍රශ්ණය සම්බන්ධයෙන් නම් සුලුවෙන් හෝ අත්දැකීම් තිබෙන බවට කිසිම සැකයක් නැත.

මව්පිය උකුල් තලයේ උණුසුමේ නැලවුන කුඩා දරුවන් කාලයාගේ ඇවෑමෙන් යොවුන් වියට පත්වීමත් සමගම තම ස්වාධීනත්වය පතා කරන අරගලය හමුවේ ඇතිවන දෙමාපිය දූදරු ගැටුම සදාතනිකවම අපට අසන්නට දකින්නට ලැබෙන්නකි. නමුත් ශ්‍රී ලංකාවෙහි හෙල කුල සිරිතට සාරධර්මවලට අනුකූලව ඇති දැඩි වුණ දෙමව්පියන්ට තම යොවුන් වියත් මෙහි යෞවනයන්ගේ ජීවන රටාවත් අතර දක්නට ලැබෙන්නේ අහසට පොලව මෙන් පරස්පරයකි. බුද්ධියට නොව හැඟීම්වලට වහල් වන එම වයස් සීමාව තුල තම දරුවන් නොදැනුවත්කම නිසා හෝ වැරදි මාර්ගයකට යොමුවේදෝයි බියෙන් ඔවුන් වෙනම ඇස ගසාගෙන සිටීමට දෙමව්පියන් පෙළඹේ. දරුවන් දෙමව්පියන්ගේ මෙම විශේෂ ආරක්ෂාව නොරුස්සයි. එමෙන්ම විචාර බුද්ධියෙන් යමක් කල්පනා කිරීමට තරම් මුහුකුරා නොගිය දරුවන් තම දෙමව්පියන්වද නොරුස්සනx නොතකන තැනට පත්වේ.

මැදිවියේ දෙමව්පියන්ට තම උණුසුමින් ඈත්වන දරුවන් නිසා ඇතිවන සාංකාව මෙන්ම ඔවුන්ගේ සමහර ක්‍රියා පිලිවෙත් නිසා ඇතිවන මානසික පීඩනයට එකතුවන අනික් බර වන්නේ දරුවන්ගේ අනාගතය ගැන අහස උසට ඇතිකරගෙන තිබෙන බලාපොරොත්තුවල පරිමාවයි. තමන්ගෙන් ගිලිහුන කිරුල තම දරුවන්ගේ හිස මත දකින්නට පෙරුම්පුරන දෙමව්පියන් දරුවන්ගේ අධ්‍යාපනය ලබන පාසල අමතර පන්ති පෙනී සිටින විභාග වැනි මෙකී නොකී සියලුම දේ ගැන උවමනාවටත් වඩා කරදර වීම නිසා ඇති කරගන්නේ විශාල මානසික පීඩනයකි.

අප ජීවිතයේ මැදිවියට එළඹෙන කල ජීවත්ව සිටින අපේ දෙමව්පියන් ඔවුනගේ දිවි ගමනේ අවසාන අග්ගිස්ස කරා ළං වේ. අප කුඩා උන් කල මහා වනස්පතීන් බඳු වූ ඔවුනගේ සෙවන යට සුරක්ෂිතව හිඳ බිඳෙන් බිඳ උස් මහත් වූ අප ලඟ ඔවුන් අසරණ වන මෙම කාලයේදී තමන්ට හැකි උපරිම ආකාරයෙන් ඔවුන්ට ආදරය දක්වමින් ලෙඩ දුකට බලමින් ඔවුන්ගේ අවසන් කාලය සංතෝෂයෙන් තැබීම දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු ප්‍රධාන යුතුකමක් වේ. එනමුදු දෙමව්පියන්ගෙන් වෙන් වී මූදු හතකට මෙහා සිටින අපල මේ යුතුකම හරියාකාරව ඉටු කරන්නේ කෙසේද? අප පත්වී සිටින ආර්ථික ගැටලුවල ස්වභාවය දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා රැකියාවේ නිවාඩු ප්‍රශ්ණ වැනි නොයෙකුත් හේතූන් මත බොහෝවිට අප ලංකාවට යන්නේ අවුරුදු දෙකකට වරක් හෝ ඊටත් වැඩි කාලපරතරයක් ඇතිවය. මෙසේ මසක් හෝ දෙමසක් පමණ ලංකාවේ ගතකරන අපටල අපගේ මහලු දෙමව්පියන් අපෙන් බලාපොරොත්තුවන රැකවරණය සැලසීම සිදුකළ හැක්කේ කෙසේද? මා මීට ඉහතින් සඳහන් කළ කරුණු සියල්ලම තරාදියේ එක පසකට දමා අපගේ දෙමව්පියන් සම්බන්ධයෙන් ඇතිවන මෙම ගැටලුව අනෙක් පසට දැමූවත් තරාදිය තුලනය වන බව මගේ හැඟීමයි. දෙමව්පියන් සම්බන්ධයෙන් අප තුළ ඇතිවන සංකාවල මානසික වේදනාව එතරම්ම විශාලය. අපෙන් වතුර උගුරක් නොබීම ඔවුන් සදහටම දෑස් පියා ගතහොත් ඇතිවන්නේ මොන තරම් පසුතැවිල්ලක්ද? එයින් මිදීමට නම් අප ජීවත්ව සිටින තුරා නොහැකි වනු ඇත.

මෙවන් වූ බොහෝ කරුණු කාරණා නිසා විඩාවට සංකාවට මානසික වේදනාවට බඳුන්වන අප මෙම කාලයේදී ගන්නා සෑම තීරණයක්ම විවේකී මනසකින් සහ විචාර බුද්ධියකින් වරක් නොව දෙවරක්ම හොඳින් සිතා බලා ගතයුතු වේ. එමෙන්ම ප්‍රියකරන සංගීත භාණ්ඩයක් වාදනය කිරීම ඉගෙන ගැනීමල සිත නිවන මියුරු සංගීතයකට සවන් දීම හෝ තමන් අදහන ආගමක කියැවෙන පරිදි සිතිවිලි දමනය කරන යම් ක්‍රමයක් උදාහරණයක් ලෙස බුදු දහමේ නම් භාවනාව වැනි ප්‍රගුණ කිරීම මගින් චෛතසික පාලනය කරගැනීම අපේ මැදිවියේ තැවුල් නිවීමට යම් තරමකට හෝ උපකාරී වනු ඇත. එසේ නොවුනහොත් අපෙන් කොටසක් මානසික ලෙඩුන් වන දිනය වැඩි ඈතක නොවනු ඇත.

## සංස්කාරක තුමා,-සන්නස"

පුවත් පත් කලාව සම්මානයට පාත්‍ර වූ වෘත්තියකි. ඒ සඳහා අදහස් ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ප්‍රමාණවත් නොවේ. එහි ලා විමර්ශනයට, කුණු කන්දල් අතුරින් සත්‍යය තෝරා බේරා සොයා ගැනීමට, පමණක් නොව සදාචාරාත්මක හා ආචාර ධර්මානුකූල දෘෂ්ටියකින් හරි වැරදි විනිශ්චය කිරීමටත් කුසලතාවක්ද තිබිය යුතුය.

කාලයක සිට, සිංහල ප්‍රජාව අතර බෙදා හරිනු ලබන පුවත්පත්වලට ලියන ලිපි මගින් පුවත්පත් කලාවට පිවිසෙන්නට තැත් කරන්නවුන් ලියන ලිපි කියවීමෙන් මම විස්මයටත්, කණගාටුවටත් පත් වී ඇත්තෙමි. සෑම කෙනෙකුටම ෂේක්ස්පියර්ලා නොහොත් හෙමින්වේලා වන්නට නොහැකි හෙයින් ලේඛනයෙහි ලා ඔවුන් සතු හැකියාව නොතකා හැරියත්, රට නිසා සත්‍ය වාර්තා කිරීමෙහි ලා ඔවුන් මෙහෙයවනු ලබන අරමුණ පිළිබඳව මා තුළ හටගන්නේ සැකයකි. හරි හැටි විමසා බැලීමකින් තොරව ලියන එම වාර්තා බොහෝ විට තමන්ගේම අභිප්‍රායන් ඉටුකර ගැනීමේ ප්‍රයත්න ලෙසින් පෙනී යන්නේය.

දයා සිල්වා විසින් ලියන ලදුව -සන්නස" පුවත්පතේ ඔක්තොම්බර් කලාපයේ පළ කැරුණු ලිපිය ඒ පිළිබඳව නිදසුනක් සේ දක්වමි.

1. 3222 ගුවන් විදුලි මාර්ගය ඔස්සේ මුල් වැඩසටහන 1989.06.18 වැනි දින ප්‍රචාරය කළ අවස්ථාවේ මයික්‍රපෝනය භාරව සිටියේ උපා උපදාසය. උපා සහ බන්දු දිසානායක යන දෙදෙනා විසින් මධ්‍ය පාලන පුවරුව හසුරුවන ලදී. ඉංග්‍රිසි සිංහල ප්‍රවෘත්ති සම්පා දනය, සම්බන්ධීකරණය හා කියවීම කිංග්ස්ලි එදිරිවීර විසින්ය. සිංහල ප්‍රවෘත්ති කියවූයේ ස්වර්ණා උපදාසය. සංගීත අංශය සරත් විතානච්චි විසින් හසුරුවන ලදී. දයානන්ද ප්‍රජා ප්‍රවෘත්ති භාරව ක්‍රියා කළ අතර තවත් බොහෝ දෙනෙක් වැඩසටහන් සහාය වූහ.

2. ශ්‍රී ලන්කන් නිව්ස් නමින් සිංහල පුවත් පත නිකුත් කිරීමට පුරෝගාමී වූයේ රොඩිනි අරඹෙවෙල, ඔල්ගා මෙන්ඩිස්, කිංග්ස්ලි එදිරිවීර, මහින්දපාල සහ කරූ ලියනා රච්චි යන ඒ පස්දෙනා අරමුදලක් ඇතිව සමාගමක් පිහිටුවනු ලැබීය. පසුව කොටස් නිකුත් කළ විට හතර දෙනෙක් ඩොලර් 5,000 බැගින් යෙදවූහ. ශ්‍රී ලංකාවේ රාජකාරියක් සඳහා ගිය නිසා මහින්දපාල මුදල් යෙදවූයේ නැත .

3. පළමු සිංහල පාසල පටන් ගත්තේ 1978 තරම් ඈත අවධියක ය. ඒ පිළිබඳ අදහස් මතුවූයේ ජෝ වික්‍රමසිංහගේ නිවසේ පැවති සුහද හමුවකදීය. ප්‍රධාන සංවිධායකයන් වූයේ කිංගිස්ලි එදිරිවීර සහ කරූ ලියනාරච්චි ය. මේ පන්ති පවත්වන ලද්දේ ක්ලේටන්හි මොනෑෂ් සරසවියේ යුනියන් ගොඩනැගිල්ලේ ය.

ඉහත කරුණ පිළිබඳ සත්‍යතාව තහවුරු කරණුවස් පහත සඳහන් සාදක ඉදිරිපත් කළ හැකිය.

1.පටිගත කරන ලද ගුවන් විදුලි වැඩසටහන් .
2.ශ්‍රී ලන්කන් පුවත් පතේ ලියා පදිංචි කිරීමේ අංකය, මූල්‍ය වාර්තා, ශ්‍රී ලන්කන් පුවත් පත්වල ACN අංක.
3. සිංහල පන්ති ගැන ප්‍රචාරය කරමින් කරන ලියනා රච්චි විසින් එච්. බී. එස්. ගුවන් විදුලියෙන් කරන ලද නිබන්ධන.

ඒ නිසා ඇත්ත තත්වය නොදන්නා පුද්ගලයන් ජනතාව ඉදිරියේ විකට දර්ශන ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටින ලෙස ඉල්ලා සිටිමි. ඒවා දකින සමහරකු තුළ හටගන්නේ අනුකම්පාවකි. තවත් අයට විනෝදයක් ම වන්නේය.

මරීනා එදිරිවීර